**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2008/2009**

**ගිවිසුම් හා නියෝජ්‍යත්ව නීතිය - LWU 2311**

**කාලය පැය 03 යි.**

---

දිනය - 2009 මාර්තු 21 වන දින          වේලාව - පෙ.ව.09.30- ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න **පහකට** (5) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**1 වන කොටස - නියෝජ්‍යත්ව නීතිය**

මෙම කොටසින් **එක්** (1) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) විසඳී ඇති නඩු තීරණ අනුසාරයෙන් නියෝජ්‍යත්ව නීතියෙහි 'නියම අධිකාරය' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(ආ) අනුමත කිරීමෙන් (Ratification) නියෝජ්‍යත්වය ඇතිවන 'පසුව ලැබෙන අධිකාරය' නමැති සංකල්පයෙන් අදහස් වනුයේ කුමක් ද?

02. (අ) පර්චස් 60 ක බිම් ප්‍රමාණයකින් යුතු තම ගෘහය විකිණීම සම්බන්ධ සියළුම කටයුතු සමන් විසින් රනිල්ට බාරදෙන ලදී. තවද, මාස 3 ක් ඇතුළත එම ගෙය මිළදී ගැනීමට ගැනුම්කරුවකු නොවුවහොත්, විකිණීමේ මුදලින් 3% ක කොමිස් මුදලක් රනිල්ට ගෙවීමට සමන් එකඟ විය. එම තෙමසක කාලය ඇතුලත දී, එම දේපල මිළදී ගැනීමට කැමැත්තක් දැක්වූ අජිත්ව, රනිල් විසින් සමන්ට හඳුන්වා දෙන ලදී. එම දේපල මිළදී ගැනීමට අජිත් විසින් ඒ අවස්ථාවේදී අර්පණයක් කළද, පසුව එම නිවස පිහිටි ඉඩම් ප්‍රමාණය පර්චස් 50 ක් පමණ වන බව ඔහු දැනගත් හෙයින්, අජිත් තම අර්පණය පසුව ඉල්ලා අස්කර ගන්නා ලදී.

පසුව සමන් විසින් එම දේපල, තමා විසින් සොයා ගන්නා ලද ගැනුම්කරුවකු වූ ලක්ෂ්මන්ට විකුණන ලදී. තම කොමිස් මුදල සමන්ගෙන් ලබා ගැනීමට රනිල් කැමැත්තක් දක්වයි.

රනිල්ට උපදෙස් දෙන්න.

(ආ) ප්‍රනාන්දුට අයත් වත්ත විකිණීමට ඔහු ජයවීරට උපදෙස් දී, විකුණුම් මිළෙන් 3% ක කොමිස් මුදලක් ගෙවීමට එකඟ විය. ජයවීර විසින් එම වත්ත මිළදී ගැනීමට අපේක්ෂා කල ගැණුම්කරුවකු වන සිරිසේනව, ප්‍රනාන්දුට හඳුන්වා දෙන ලදී.

මෙම වත්ත තමා වෙත විකිණීමට ඉඩ සැලසීමට සිරිසේන විසින් ජයවීරට කොමිස් මුදලක් ගෙවා ඇති බව පසුව ප්‍රනාන්දු දැන ගනී.

ප්‍රනාන්දුට උපදෙස් දෙන්න.

03. එළිදරව් කරන ලද ප්‍රධානියා සහ එළිදරව් නොකරන ලද ප්‍රධානියා යන සිද්ධාන්ත දෙක අතර ඇති වෙනස්කම් දක්වමින්, තෙවන පාර්ශ්වකරුවකුට විරුද්ධව ප්‍රධානියකුට ඇති අයිතීන් සඳහන් කරන්න.

## <u>2 වන කොටස - ගිවිසුම් නීතිය</u>

ප්‍රශ්න **හතරකට (4)** පමණක් පිළිතුරු සපයන්න.

04. රංජිත් විසින් තම මෝටර් කාරය විකිණීමට තැත් කිරීම පිණිස එය තම නිවස පිටත නවත්වා කාරයෙහි වින්ඩ්ස්ක්‍රීන් වීදුරුවෙහි පහත දැක්වෙන ආකාරයට දැන්වීමක් අළවන ලදී.
'විකිණීමට තිබේ. ඉතා අනර්ඝ තත්ත්වයේ ඇත. - එක් අයිතිකරුවකු පමණි. රු.750,000/= කට හෝ ඊට ආසන්න අර්පණයකට. අංක 215, ස්ටැෆර්ඩ් පාර වෙත පැමිණෙන්න හෝ අංක 5234269 දුරකථනයට පමණක් අමතන්න.'

සඳුදා පෙ.ව.09.00 ට, තිස්ස එම කාරය දකී. නමුත් ඔහු තම රැකියාව සඳහා යෑමට ප්‍රමාද වන හෙයින්, කාරය තිබූ ස්ථානයෙහි නැවතීමට ඔහුට අපහසු වේ. තිස්ස තම රැකියා ස්ථානයට පිවිසියාට පසුව රංජිත්ට දුරකථනයෙන් කථාකොට කාරය සඳහා රුපියල් 700,000/= ක අර්පණයක් ඉදිරිපත් කලවිට, එම අර්පණය සලකා බලන බව රංජිත් පවසයි.

සඳුදා පෙ.ව.11.00 ට සේන නැමැත්තා රංජිත්ගේ නිවස වෙත පැමිණි විට එහි සිටියේ රංජිත්ගේ දුව වන රේඛා පමණි. එම නිසා ඔහු පහත සඳහන් කරුණු අඩංගු ලිඛිත පණිවිඩයක් එහි තබා යයි.

'සඳුදින පෙ.ව.11.05, මෙම කාරය මා වෙත දීම පිණිස වෙන්කර තබන්න. මේ සමඟ රුපියල් 750,000/= ක චෙක්පතක් ඇත. - මීට සේන'

රේඛා විසින් මෙම ලිඛිත පණිවුඩය රංජිත්ගේ කාර්යාල කාමරයේ ඔහුගේ මේසය මත තබයි. සඳුදා අපරභාගයේදී තිස්සගේ අර්පණය පිළිගැනීමට රංජිත් තීරණය කොට පහත සඳහන් කරුණු අඩංගු ලිපියක් ප.ව.02.30 ට තිස්සගේ ව්‍යාපාරික ලිපිනයට රංජිත් විසින් යවයි.

'ඔබ ඉදිරිපත් කල කොන්දේසි අනුව කාරය විකිණීමට මම එකඟ වෙමි. අඩු කළ මිළ නිසා, මුදල්වලින් ඔබට ගෙවිය හැකි ද?'

සඳුදින ප.ව.04.30 ට සේන විසින් කරන ලද ප්‍රතිග්‍රහණය සඳහන් පණිවුඩය රංජිත් විසින් කියවා එකෙනෙහිම තිස්සගේ ව්‍යාපාරික ස්ථානයට දුරකථනයෙන් අමතා, එහි ඇති පිළිතුරු කථා පටිගත කරන යන්ත්‍රයෙහි (Recorded Answering Service) පණිවුඩයක් තබයි. 'මාවිසින් එවන ලද ලිපිය නොසලකා හරින්න. එම වෙළඳ කටයුත්ත අවසන් වී ඇත.- රංජිත් '

තිස්ස එම කාලය තුළ ව්‍යාපාරික කටයුතු සඳහා වෙනත් ස්ථානයකට ගොස් සිටි හෙයින් එම පටිගත කරන ලද පණිවුඩයට සවන් දුන්නේ බදාදා සන්ධ්‍යා සමයේදී ය.

සඳුදා පස්වරු 02.15 ට සරෝජිනී කාරයෙහි අළවා ඇති දැන්වීම දැක එම අර්පණය පිළිගැනීමේ ලිපියක් හා එහි අඩංගු රුපියල් 750,000/= ක චෙක්පතක් වහා සකස් කොට, එම ලිපිය ප.ව.03.00 ට තැපැල් කන්තෝරුව විසින් කරන ලද තැපැල් ලිපි රැස්කරන වේලාවට පෙර තැපෑළට දැමීමට ක්‍රියා කරයි. නමුත් සරෝජිනී විසින් යවන ප්‍රතිග්‍රහණ ලිපියෙහි ලිපිනය වැරදි ලෙස සඳහන් කිරීම නිසා, එම ලිපිය ලැබෙනුයේ සිකුරාදා ය.

එක් එක් පාර්ශ්වකරුවකුට එකිනෙකාගේ නෛතික තත්ත්වය පිළිබඳව උපදෙස් දෙන්න.

05. නිරන්ජන්, චිත්‍ර සහ පෞරාණික භාණ්ඩ මිළදී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයක යෙදී සිටී. සේනක නමැති කලාත්මක භාණ්ඩ වෙළෙන්දකු සන්තකයේ ඉතා සුප්‍රසිද්ධ සිත්තරෙකු වූ විජේසිංහ නමැත්තා නිර්මාණය කරන ලද චිත්‍රයක් විකිණීමට ඇති බව නිරන්ජන් දැන ගනී. මීට ඉහත දී ඇති කරගත් ගිවිසුමක් වෙනුවෙන් ණයක් ගෙවීමට ඇති හෙයින්, සේනක විසින් එම චිත්‍රය තමාට කෙසේවත් නොවිකුණන බව නිරන්ජන් දනී. එම නිසා නිරන්ජන් සේනකට දුරකථනයෙන් කථා කොට මෙසේ කියයි. "මේ කථා කරන්නේ දේශමාන්‍ය කුරුප්පු මහතාය. මම දැන් නැවති සිටින්නේ රෝයල් ප්ලාසා හෝටලයෙහිය. ඔබ විසින් විකිණීම පිණිස දැන්වීමක් පළකරන ලද විජේසිංහ විසින් අඳින ලද චිත්‍රය මිළදී ගැනීමට කැමැත්තෙමි. ඒ සම්බන්ධව මිළක් නියම කිරීම පිණිස එකඟත්වයට පැමිණීම පිණිස මම හෙට දින ඔබගේ ව්‍යාපාරික ස්ථානයට පැමිණෙන්නෙමි."

දේශමාන්‍ය කුරුප්පු මහතාගේ නම හෝටලයේ නැවති සිටින අමුත්තන්ගේ ලයිස්තුවේ සඳහන්ව ඇති බව රෝයල් ප්ලාසා හෝටලයේ කළමනාකාර වරයාගෙන් සේන දැනගත් පසු, එවැනි ඉතා වැදගත් ප්‍රසිද්ධ පුද්ගලයකු තම අනුග්‍රාහකයකු වශයෙන් ලැබීම ගැන ඉතා සතුටු වෙයි. ඇත්ත වශයෙන්, දේශමාන්‍ය කුරුප්පු මහතාගේ චෙක් පොත සොරකම් කොට එම නමින් හෝටලයේ නේවාසිකව සිටිනුයේ නිරංජන්ය.

ඊට පසු දින, ඉතා මනාලෙස වෙස් වලාගෙන, නිරංජන් සේනකගේ ව්‍යාපාරික ස්ථානයට පැමිණෙයි. චිත්‍රය වෙනුවෙන් මිළකට එකඟ වී ඒ සම්බන්ධව සේනක විසින් නිරන්ජන්ගෙන් චෙක්පතක් ලබා ගැනීමෙන් අනතුරුව, විජේසිංහගේ චිත්‍රය රැගෙන යාමට නිරංජන්ට සේනක ඉඩ දෙයි. නිරන්ජන් විසින් එම චිත්‍රය තම ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රදර්ශනය කරන ලදුව, එකෙනෙහිම මෙන් එම චිත්‍රය

ජයන්ත නමැති පුද්ගලික චිත්‍ර රැස්කරන්නෙකුට මුදලට විකුණයි. චෙක්පත අගරු වී ඇති බවත් (dishonoured), එම විජේසිංහගේ චිත්‍රය දැන් ජයන්තගේ සන්තකයේ ඇති බවත්, සේනක මේ අවස්ථාවේදී දැන ගනී.

සේනකට උපදෙස් දෙන්න.

ජයන්තට එම චිත්‍රය විකිණීමට පෙර චෙක්පත අගරු වී ඇති බව සේනක විසින් දැනගත් පසු , ඒ සම්බන්ධව ඔහු පොලිසියට දැනුම් දී ඇත්නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේ ද?

06. (අ) නිශ්ශබ්දතාවය අවනිදේශනයකට තුඩුදේ ද?
විනිශ්චිත නඩු තීරණ අනුසාරයෙන් ඉහත කී ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ආ) (i) X ගේ ව්‍යාපාරය Y ට විකිණීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී, තම ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 3 ක් බවට X විසින් සඳහන් කොට, එම කියමන සනාථ කිරීම සඳහා Y ට යම් ලේඛණයක් ඉදිරිපත් කරන ලදී. එම ලේඛණ පරීක්ෂා නොකොට, Y විසින් ව්‍යාපාරය මිළදී ගන්නා ලදී. එම ලේඛණ Y විසින් පරීක්ෂා කරන ලද්දේ නම්, X ගේ ප්‍රකාශයන් ව්‍යාජ බව Y ට එළදරව් වනු ඇත.

Y ට උපදෙස් දෙන්න.

(ii) ප්‍රවාහන ව්‍යාපාරයක් විකිණීම සඳහා පෙබරවාරි මස තුළ සාකච්ඡා මෙහෙයවීමේදී, එමගින් මාසිකව තමන් උපයන මුදල රුපියල් 100,000/= ක් බව B විසින් A ට ප්‍රකාශ කරයි. B ගේ අසනීපය හේතුකොටගෙන, ජූලි මස ගිවිසුම අත්සන් කරන විට B ගේ මාසික ඉපැයීම රුපියල් 20,000/= දක්වා අඩු වී ඇත. එම අවස්ථාවේදී තම මාසික ඉපැයීම අඩුවීම සම්බන්ධව එළිදරව් නොකල නිසා, B විසින් ඉහත දී කරන ලද ප්‍රකාශය නිවැරදි නොකරන ලදී.

නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

07. ගිවිසුම අසම්පූර්ණ ලෙස ඉටු කිරීම සම්බන්ධව මතුවන ගැටළුවල කටුක ස්වභාවය ලිහිල් කිරීම සඳහා අධිකරණයන් විසින් උපයෝගී කොටගෙන ඇති රීතීන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

08. සිරිපුර ක්‍රිකට් ක්‍රීඩා සමාජයේ ලේකම් වශයෙන් ජෝන් විසින් ඕයර්ලන්තය සහ රුරිටේනියාව අතර කොළඹ පැවැත්වීමට නියමිත අන්තර්ජාතික ක්‍රිකට් තරඟය නැරඹීමට එම සිරිපුර ක්‍රිකට් ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 50 ක් රැගෙන යාමට පැරමවුන්ට් සමාගමෙන් බස්රථයක් කුලියට ගනී. එම ගිවිසුමේ කොන්දේසියක් ප්‍රකාර: 'බස් සමාගමට වැඩ කරන දින තුනක නොතිසියක් දුනහොත් එම ගිවිසුම අවලංගු කල හැක. එසේ නොවුනහොත්, මුළු කුලියම ගෙවිය යුතුය.' මෙම ගමනට කුලිය වශයෙන් රුපියල් 9,000/= ක් බස් සමාගම විසින් අයකරන ලද අතර, ජෝන් විසින් අත්තිකාරම් වශයෙන් රුපියල් 5,000/= ක් ගෙවයි. තම බස් රථ මාර්ග ධාවනයට සුදුසු බවට බස් සමාගම සහතික වන හෙයින්, එම ගමනට යොදා ගැනීමට නියමිත බස් රථය ගමනට පෙර දින නියමාකාරයෙන් සර්විස් කරනු ලැබේ. කෙසේ වෙතත්, දේශපාලන උද්ඝෝෂණකරුවන් විසින් ක්‍රිකට් පිටියෙහි නොයෙකුත් ස්ථානයන්හි වලවල් හාරා ඇති හෙයින්, මෙම ක්‍රිකට් තරඟය එදින නොපැවැත්වෙන බව ගමන ආරම්භ වියයුතු දින උදෑසන දැනුම් දෙනු ලැබේ. එකෙනෙහිම ජෝන් විසින් මෙම ගිවිසුම ව්‍යර්ථ වී ඇති බව පවසා, තමා දුන් අත්තිකාරම් මුදල වන රුපියල් 5,000/= ඉල්ලා සිටී.

පාර්ශ්වකරුවන්ට උපදෙස් දෙන්න.

09. (අ) "සාමාන්‍ය වශයෙන් හෝ යම්කිසි සිදුවීමක් ඇතිවීම නිසා මරණය අපේක්ෂාවෙන් කරන ලද විශේෂ ත්‍යාගයක් මරණාසන්න ත්‍යාගයකි. අපේක්ෂිත මරණය සිදුවූ විට පමණක් එම ත්‍යාගය ස්ථිර වේ."

මරණාසන්න ත්‍යාගයක් ඇති කිරීම සහ අවසන් කිරීම සම්බන්ධයෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.

(ආ) එක් මාසයක කාලයකින් පසුව විවාහ වීමට කිත්සිරි සහ විමලා එකඟ වෙයි. තෑග්ගක් වශයෙන් තමාට අයත් එක් නිවසක් විමලාගේ පියා වන සිල්වා විසින් කිත්සිරිට පැවරීය. පෑනක් සහ අත්ඔරලෝසුවක් තෑගි වශයෙන් විමලා විසින් කිත්සිරිට දෙන ලදී. පසුව විමලාව විවාහ කර ගැනීමට කිත්සිරි ප්‍රතික්ෂේප කරන අතර සිල්වාට ද පහර දෙයි. නිවස නැවත ලබා ගැනීමට සිල්වා අපේක්ෂා කරන අතර පෑන හා අත් ඔරලෝසුව නැවත ලබා ගැනීමට විමලා අපේක්ෂා කරයි.

සිල්වා සහ විමලාට උපදෙස් දෙන්න.

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් සම්බන්ධව සටහන් ලියන්න.

(අ) අයුතු බලපෑම
(ආ) ගිවිසුම මූලිකව කඩ කිරීමක්
(ඇ) ගිවිසුම් සම්බන්ධය පිළිබඳ සිද්ධාන්තය (Privity of contract)
(ඈ) නිදහස් කිරීම හෝ අත්හැරීම
(ඉ) අලාභ ප්‍රමාණය

හිමිකම් ඇවිරිණි.